**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය - 2022**

----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැකවෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇතිබව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් කළමනාකරණයෙන් සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකිම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්ව මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්ප නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම්තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ ආදලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව

හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්‍ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.256,799 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.265,521 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.522,320 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් රජයේ ආධාර වැඩිවීම හා පෞද්ගලික පඩිනඩි අඩුවීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරන අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය අනුව විගණකාධිපතිවරයා වෙත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු වුව ද, 2022 වර්ෂයට අදාල වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2023 පෙබරවාරි 28 දින වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2023 පෙබරවාරි 28 දින වන විට 2022 වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව පිළියෙල කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවත් ඉදිරියට එය නිවැරදි කර ගැනීමට සටහන් කරගත් බවත් දන්වා තිබුණි. | විගණන පනතට අනුව කටයුතු කළ යුතු වීම. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්‍ෂමතා

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය වන විට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවා වසර 06 ඉක්මවා ඇතත් එහි ප්‍රධාන කාර්යභාරය වන, සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) සහ එහි ප්‍රතිඵලයක් වන ඒකාබද්ධ සුබසාධන | විගණන නිරීක්ෂණ සමග එකඟ වන බව දන්වා තිබුණි. | මණ්ඩලය පිහිටුවීමේ අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | කළමනාකරණ කිරීමත්, තොරතුරු තාක්ෂණික ප්‍රතිපත්ති සැකසීමත් සුභ සාධන ප්‍රතිලාභ ගෙවීම සඳහා ප්‍රතිලාභියා හඳුනාගැනීම හා ඒ සඳහා පොදු නිර්නායක හා දර්ශක සකස් කිරීමත් මනා නිපුණතා වලින් හෙබි වූ කාර්ය මණ්ඩලයක් බඳවාගැනීම 2022 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | | |
| (ආ) | සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ මූලික තිරසාර සංවර්ධන අරමුණ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ඒකාබද්ධ සුබසාධක කළමනාකරණ පද්ධතියක් සකස් කිරීමත්, සුබසාධක ප්‍රතිලාභ ගෙවීමට සුදුසු පුද්ගලයන් ව තෝරාගෙන ප්‍රතිලාභ ගෙවීමත්ය. නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම අරමුණු ඉටු කර ගැනිමට අවශ්‍ය වැඩසටහන් හා පද්ධතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | 2022 වර්ෂයේ ආරම්භයේ සිට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය සඳහා කොමසාරිස්වරයෙක් සහ අධ්‍යක්ෂ මණ්ඩලයක් නොසිටි අතර 2022 ජූලි මාසයේ කොමසාරිස්වරයෙක් සහ අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීමෙන් පසු සුබසාධක ප්‍රතිලාභ ගෙවීමට සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කරන ලද බවත් මෙම ක්‍රියාවලිය සඳහා අවශ්‍ය පනත් සම්මත කර ගැනීම ඉන්පසු සිදු විය. ඊළඟ පියවර වශයෙන් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මහජනතාවගෙන් අයදුම්පත් කැඳවීම සිදු වූ අතර අවස්ථා දෙකකදීම අයදුම්පත් භාර ගන්නා කාල සීමාව දීර්ඝ කරන ලදී. තවද මෙය සම්පූර්ණයෙන් පරිගණක පද්ධතියක් ඔස්සේ ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් බැවින් ඒ සඳහා නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබා දීමට සිදු වීම නිසාත්, ඇතැම් රාජ්‍ය නිලධාරීන් මෙම වැඩසටහනට සහාය නොදක්වා ඉවත් වීම නිසාත් මෙම වැඩසටහන නියමිත කාල සීමාව තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් දැනට මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරමින් පවතින බවත් දන්වා තිබුණි. | මණ්ඩලයට අදාල තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමට පියවර ගත යුතුවීම. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| | **විගණන නිරීක්ෂණ** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 2 වගන්තිය අනුව | සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිවරයා හා අධ්‍යක්ෂ | පනතේ විධි විධාන පරිදි කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, සභාපතිවරයාගෙන් සහ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සමාජිකයින් 4 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් 2022 ජනවාරි සිට ජූලි මාසය දක්වා සභාපතිවරයෙක් සහ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා සමාජිකයන් දෙදෙනෙකු නොමැතිව කටයුතු කර තිබුණි. | මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු 2023 ජූලි මාසයේද තවත් සාමාජිකයන් දෙදෙනෙකු සැප්තැම්බර් මාසයේද පත්කර ඇති බව දන්වා තිබුණි. | |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට පැවති කාර්ය මණ්ඩල තොරතුරු අනුව අනුමත තනතුරු සංඛ්‍යාව 17 ක් වූ අතර ඉන් තනතුරු 03 ක, පුරප්පාඩු 05 ක් සහ තනතුරු 01 ක අතිරික්තයක් පැවතුනි. | 2018.07.16 දින සිට නියෝජ්‍ය කොමසාරිස් තනතුරු 02 ක් යටපත් කර අතිරේක කොමසාරිස් හා සහකාර කොමසාරිස් තනතුරු 01 බැගින් ඇතිකර ඇත. | මණ්ඩලයේ කටයුතු සිදු කිරීමට අවශ්‍ය පරිදි කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කළයුතු වීම. |